**සුනාමි බලපෑමට ලක්වූ ප්‍රදේශවල තෘතියික අධ්‍යාපනය හා පරිපාලන යටිතල පහසුකම් ශක්තිමත් කිරීම සඳහා වූ වැඩ සටහන -2013**

---

සුනාමි බලපෑමට ලක්වූ ප්‍රදේශවල තෘතියික අධ්‍යාපනය හා පරිපාලන යටිතල පහසුකම් ශක්තිමත් කිරීම් සඳහා වූ වැඩ සටහනේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) හා අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වූ කුවේට් අරමුදල අතර 2005 නොවැම්බර් 11 දින එළඹි අංක 711 දරන ණය ගිවිසුම ප්‍රකාරව මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරේ. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන තෘතියික අධ්‍යාපනය ශක්තිමත් කිරීම සඳහා වූ වැඩ සටහනේ මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ පමණක් මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ අඩංගු වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

සුනාමි බලපෑමට ලක්වූ ප්‍රදේශවල තෘතියික අධ්‍යාපනය හා පරිපාලන යටිතල පහසුකම් ශක්තිමත් කිරීම සඳහා වූ වැඩ සටහනේ ණය ගිවිසුමට අනුව , උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. වැඩසටහනේ අරමුණු වනුයේ සුනාමි බලපෑමට ලක්වූ දිස්ත්‍රික් 4 ක උසස් තාක්ෂණික ආයතන පහක්, විශ්ව විද්‍යාල දෙකක නේවාසිකාගාර දෙකක් හා විශ්ව විද්‍යාල දෙකක තොරතුරු තාක්ෂණ ආයතන දෙකක් ඉදිකිරීම සහ එම ආයතන සඳහා අත්‍යවශ්‍ය උපකරණ සැපයීමයි.
පසුව යාපනයේ හා ත්‍රිකුණාමලයේ විශ්ව විද්‍යාල දෙකක ගොඩනැඟිලි දෙකක් ඉදිකිරීම සඳහා ඉතිරි අරමුදල් උපයෝජනය කිරීමට 2010 නොවැම්බර් 11 දින කුවේට් අරමුදල විසින් අනුමැතිය ලබාදී තිබුණි.

ණය ගිවිසුමට අනුව, වැඩ සටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 2,400 ක් වූ අතර ඉන් රු.මිලියන 1,750 ක් හෙවත් සියයට 76.08 ක් මූල්‍යයනය කිරීමට අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වූ කුවේට් අරමුදල එකඟ වී තිබුණි. වැඩ සටහන එහි කටයුතු 2005 සැප්තැම්බර් 01 දින ආරම්භ කරන ලද අතර 2012 ජුනි 15 වන විට නිම කිරීමට නියමිත විය. කෙසේ වුවද 2004 දෙසැම්බර් 31 දක්වා වැඩ සටහන් කාල පරිච්ඡේදය දීර්ඝ කර තිබුණි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**---------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සහ යොදාගැනීමත් අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. විගණන විෂය පථය හා මතය සඳහා පදනම**

**---------------------------------------------**

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන , ගනුදෙනු, වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල වැඩ සටහන් කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ වැඩසටහනේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා

ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු කිරීමට හැකිවන පරිදි පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද වැඩ සටහන් වියදම් , මූල්‍ය හා භෞතික වශයෙන් වැඩ සටහනේ ප්‍රගතිය, වැඩ සටහනේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඇ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල් ද්‍රව්‍ය හා උපකරණ වැඩ සටහනේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඉ) වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඊ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(උ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ

(ඌ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද බන බව.

**3.** **මතය**

**--------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇති වන බලපෑම් හැර, මාගේ මතය වනුයේ

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩ සටහන නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව, 2013 දෙසැම්බර් 31 දිනට වැඩ සටහනේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඉ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**4. මූල්‍ය ප්‍රකාශන**

**4.1 මූල්‍ය කාර්ය සාධනය**

මූල්‍ය ප්‍රකාශන හා ලබා ගත හැකි වූ තොරතුරු අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩ සටහනේ වියදම රු.මිලියන 55 ක් වූ අතර 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.මිලියන 2,094.4 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම, ඉකුත් වර්ෂය සඳහා වියදම හා 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| **වර්ගය** | **දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම** | | **2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම** |
|---|---|---|---|
| | 2013 | 2012 | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| නව ගොඩනැගිලි ඉදිකිරිම | 47.4 | 32.8 | 1,867.7 |
| ස්ථාවර වත්කම් මිලදී ගැනීම | 0.1 | නැත | 105.4 |
| උපදේශක සේවා ගාස්තු | 0.5 | 0.1 | 67.1 |
| ව්‍යාපෘති සම්බන්ධීකරණය | 7.0 | 8.6 | 54.2 |
| එකතුව | 55.0 | 41.5 | 2,094.4 |

## 5. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 5.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය හා සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය , සමාලෝචිත වර්ෂය තුළ අරමුදල් උපයෝජනය සහ 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| **ප්‍රභවයන්** | **ලබාදීම සඳහා එකඟවූ මුදල** | | **2013 වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය** | **සමාලෝචිත වර්ෂය තුළ උපයෝජනය කළ අරමුදල්** | **2013 දෙසැම්බර් 31 දක්වා උපයෝජනය කළ අරමුදල්** | |
|---|---|---|---|---|---|---|
| | **කුවේට් ඩිනාර් මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **කුවේට් ඩිනාර් මිලියන** | **රු.මිලියන** |
| කුවේට් අරමුදල | 4.02 | 1750 | 20 | 20 | 4.00 | 1742 |
| ශ්‍රී ලංකා රජය | - | 650 | 35 | 35 | | 352 |
| | | 2400 | 55 | 55 | | 2094 |

2007 සිට 2010 දක්වා කාල පරිච්ඡේදය තුළ අවස්ථා 14 කදී ඉල්ලුම් කරන ලද රු.187,473,743 ක් වටිනා ප්‍රතිපූර්ණ ඉල්ලුම්පත් 2013 දෙසැම්බර් 31 දිනට හිඟව පැවති අතර, ඒ අනුව වැඩ සටහන් කාල පරිච්ඡේදය අවසානයේදී ශ්‍රී ලංකා රජයේ දායකයෙන් එම අතිරේක පිරිවැය දැරීමට සිදුවේ.

### 5.2 භෞතික කාර්ය සාධනය

ව්‍යාපෘතිය විසින් 2013 දෙසැම්බර් 31 දිනට සිදුකරන ලද සිවිල් වැඩ පිළිබඳ භෞතික හා මූල්‍ය ප්‍රගතිය පහත පරිදි විස්තර කෙරේ.

| සංරචකය | ඉදිකිරීම සඳහා අපේක්ෂිත ඒකක (සංඛ්‍යාව) | ඇස්තමේන්තුගත පිරිවැය | 2013 දෙසැම්බර් 31 දිනට දරන ලද පිරිවැය | 2013 දෙසැම්බර් 31 දිනට භෞතික කාර්ය සාධනය |
|---|---|---|---|---|
| ----------- | --------------- | ----------------- | ----------------- | ----------------- |
| | | රු. | රු. | |
| සිවිල් වැඩ<br>------------ | | | | |
| උසස් තාක්ෂණ ආයතන ගොඩනැඟිලි ඉදිකිරීම | 05 | 585,000,000 | 679,919,659 | 100 |
| යාපනය හා රුහුණු විශ්ව විද්‍යාල සඳහා නේවාසිකාගාර ගොඩනැඟිලි | 02 | 787,000,000 | 870,186,181 | 100 |
| නැගෙනහිර විශ්ව විද්‍යාලයේ නේවාසිකාගාර ගොඩනැඟිල්ල | 01 | 182,000,000 | 47,440,977 | 10 |
| තොරතුරු තාක්ෂණ ගොඩනැඟිලි | 02 | 171,000,000 | 195,363,423 | 100 |
| යාපනය, විශ්ව විද්‍යාලය සඳහා වෙනත් ගොඩනැඟිලි | 02 | 67,000,000 | 74,829,390 | 100 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉහත තොරතුරු අනුව, නැගෙනහිර විශ්ව විද්‍යාලය සඳහා නේවාසිකාගාර ගොඩනැඟිල්ල ඉදිකිරීම් වැඩ 2013 දෙසැම්බර් 31 දිනට සියයට 10 ක මන්දගාමී ප්‍රගතියක් දක්වා තිබුණි.

(ආ) ව්‍යාපෘති විසින් 2013 දෙසැම්බර් 31 දිනට සිවිල් වැඩ බොහොමයක් භෞතිකව නිමකර තිබුණි. කෙසේ වුවද ඒ මත දරන ලද තථ්‍ය පිරිවැය ආරම්භක මට්ටමේදී සකස් කරන ලද ඇස්තමේන්තුවට වඩා සැලකිය යුතු ලෙස ඉහළ ගොස් තිබුණි.

**6 පද්ධති හා පාලන**
--------------------

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) වත්කම් කළමනාකරණය

(ආ) වියදම් ප්‍රතිපූර්ණය කිරීම